# ඒකාබද්ධ මාධ්‍ය නිවේදනය

2018 මාර්තු 7 (කොළඹ, ශ්‍රී ලංකාව): ශ්‍රී ලංකාවේ ලෝක සෞඛ්‍ය සංවිධානය **(WHO)** සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල **(UNFPA)** ඒකාබද්ධව අද දින ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් විසින් නිකුත් කරන ලද නිවේදනය ප්‍රතිරාව නංවනු ලැබේ. එම නිවේදනය වාර්ගික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සම්බන්ධයෙන් වන අතර, අප ද ඒකාබද්ධව එම ක්‍රියාවන් ඉතා දැඩි ලෙස හෙළා දකින්නෙමු.

අම්පාර සිදුවීම විශේෂයෙන් සැලකූ විට, එය පැන නැගුණේ ප්‍රජනන අධ්‍යාපනය පිළිබඳ වැරදි තොරතුරු මත ය. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මෙම ඒකාබද්ධ නිවේදනය නිකුත් කරන්නේ එකී වැරදි මත පැහැදිලි කර දෙන්නට ය.

එක්සත් ජාතීන්ගේ වැඩ බලන ශ්‍රී ලාංකික නේවාසික සම්බන්ධීකාරකවරිය හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතවරිය වන ආචාර්ය රැසියා පෙන්ඩ්සෙ මෙසේ පවසයි: “මිනිසුන් ස්ථිරව වන්ධ්‍යාකරණයට ලක් කළ හැකි දැනට දන්නා හෝ සොයා ගත හැකි හෝ බෙහෙතක් හෝ පෙත්තක් නැත. ආහාරවලට මිශ්‍ර කළ හැකි වඳ පෙති පිළිබඳ තිබෙන අදහස බොරුවක් වන අතර වෛද්‍ය විද්‍යාත්මකව හා විද්‍යාත්මකව එසේ සිදු කළ නො හැකි ය.”

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත රිට්සු නකේන් මහත්මිය මෙසේ පැවසුවා ය: “මෙයින් පෙනී යන්නේ නිවැරදි ප්‍රජනන සෞඛ්‍ය තොරතුරු වෙත පිවිසීමේ හැකියාව විශේෂයෙන් ම තරුණ ජනයා අතර තහවුරු කිරීමේ අවශ්‍යතාවයි. ප්‍රජනන අධ්‍යාපනය පිළිබඳ වැරදි තොරතුරු වෛරය පැතිරවීමට හා වාර්ගික ගැටුම් ඇති කිරීමට පාවිච්චි කරනු ලැබේ. එය සිදු නො විය යුත්තකි. ”

ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යනු ශ්‍රී ලංකාවේ ජනයාගේ යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම වෙනුවෙන් ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතායතන දෙකකි.

*එක්සත් ජාතීන්ගේ පද්ධතිය සමග එක්ව,* නීතියේ ආධිපත්‍යයට ගරු කරන ලෙස හා මානව හිමිකම් සුරකින ලෙස ද, සියලු දෙනාගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තහවුරු කරන ලෙස ද ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල බලධාරීන්ගෙන් හා පුරවැසියන්ගෙන් ඉල්ලා සිටියි.

--

*WHO strives to build a better, healthier future for people all over the world.*
*UNFPA works to ensure universal access to sexual and reproductive health information and in upholding reproductive rights.*